ඩෙල්ෆ්ට් ප්‍රාදේශිය සභාව
යාපනය දිස්ත්‍රික්කය
--------------------------------------

1. මුල්‍ය ප්‍රකාශන
---------------------

1.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම
--------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඉකුත් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 10 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව සභාවේ සභාපති වෙත 2014 ඔක්තෝබර් 30 දින ඉදිරිපත් කරන ලදි.

1.2 මතය
-----------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මුල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ඩෙල්ෆ් ප්‍රාදේශිය සභාවේ මුල්‍ය තත්ත්වය හ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මුල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්
----------------------------------------------

1.3.1 ගිණුම්කරණ ඌනතා
--------------------------

i. මුල්‍ය ප්‍රකාශන වල නිරික්ෂණය වූ ඌනතා ආදායම් හා බැරකම වශයෙන් පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| මුල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | ආදායම | | බැරකම් | |
|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. |
| වැඩියෙන් දැක්වීම් | 01 | 104,620 | - | - |
| වර්ගීකරණ දෝෂ | - | - | 01 | 712,756 |
| අඩුවෙන් දැක්වීම් | 01 | 31,250 | 01 | 712,756 |

ii. සභාවේ වාහන 10 ක වටිනාකම තක්සේරු කර අවසාන ගිණුම් වලට ඇතුලත් කර නොතිබුණි. ඒ හේතුකොට ගෙන මෝටර් රථ වටිනාකම ගිණුම් වල අඩුවෙන් දක්වා තිබුනි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරිම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා වටිනාකම රු.663,828 ක් වූ ගණුදෙනු හයක් විගණනයේදි සන්නිරික්ෂණය කළ නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්

පහත සඳහන් නීති රිති, රෙගුලාසි සහ කළමනාකරණ තීරන වලට අනුකූල නොවීම් විගණනයේදි නිරික්ෂණය විය.

| නිති, රිති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවිම |
|---|---|---|
| ප්‍රාදේශිය සභා ( මුල්‍ය හා කළමනාකරණ ) රීති 1989 | | |
| පරිච්ඡේදය V වගන්තිය 140 | - | 160,819 ක් වූ අත්තිකාරම් නියමිත දිනට නොගෙවිම සම්බන්ධයෙන් සභා ලේකම් විසින් කටයුතු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 571 | - | වසර දෙකකට වැඩි කල් ඉකුත් වූ රු.42,396 ක තැන්පතු ආදායමට ගැනිමට කටයුතු කර නොතිබුණි. |
| 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | | |
| වගන්තිය - 152(අ) | - | රු.10,000 ඉක්මවන විනෝද කටයුතු වියදම් සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු නමුත් සභා |

අරමුදලින් වැයකල රු.8,840 ක් සඳහා එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

මුදල් රෙගුලාසි 1646 - සමාලෝචිත වර්ෂය තුළදී ඩීසල් ලීටර් 806.79 ක් සඳහා රු.94,568 ක් වැය කළ අංක එල්ජී 8966 දරන පික්අප් රථයේ දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.107,656 ක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,324,059 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

අයවැයගත ආදායම සහ වියදම සහ තත්‍ය ආදායම හා වියදම අතර පිළිවෙලින් රු.4,465,140 ක රු.4,298,239 ක විචලනයන් පැවති බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම්

සභාපති විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තුගත ආදායම තත්‍ය ආදායම සහ හිඟ ආදායම් පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2013<br>ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 515 | 62 | 34 |
| බදු කුලී | 497 | 323 | 148 |
| බලපත්‍ර ගාස්තු | 1,924 | 1,203 | - |
| වෙනත් ආදායම් | 8,561 | 6,043 | 393 |

| | | |
|---|---|---|
| 11,497 | 7,631 | 575 |
| ====== | ======= | ====== |

2.3.2 වත්කම් කළමනාකරණය

-----------------------------

රු.574,727 ක් වු බදු කුලි, ජල ගාස්තු සහ සීසෑම් යන්ත්‍ර ගාස්තු අයකර ගැනිම සඳහා තික හෝ වෙනත් ඵලදායි ක්‍රියා මාර්ගායක් සභාව විසින් ගෙන නොතිබුණි.

2.3.3 උසාවි දඩ මුදල්

---------------------

ගිණුම් වලට ඇතුලත් කිරිම සඳහා නොයෙකුත් ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් උසාවිය විසින් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා වු කාලය තුල පනවන ලද දඩ මුදල් පිළිබඳ ලැයිස්තුවක් ලබාගෙන නොතිබුණි.

2.3.4 මුද්දර ගාස්තු

-------------------

i. ලැබිය යුතු මුද්දර ගාස්තු පිළිබඳ ලැයිස්තුවක් ලබාගෙන ගිණුම්ගතකර නොතිබුණි.
ii. සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂ දෙකක් වෙනුවෙන් ලබාගත් රු.378,700 ක් වු මුද්දර ගාස්තු ගිණුම් වල හෙළිදරවු කර නොතිබුණි.

2.3.5 අවිධිමත් ගෙවිම්

----------------------

කොළඹ පවත්වන ලද ජාතික පළාත් පාලන සමුළුවට සහභාගිවිම සඳහා සභාපතිවරයා ගමන් කළ රථය සඳහා පරිභෝජනය කළ ඩීසල් ඉන්ධන වෙනුවෙන් රු.12,252 ක් ගෙවා තිබුණි. කුලියට ලබාගත් වාහනය පළිබඳ විස්තර ධාවනය කළ දුර ප්‍රමාණය ලබාගත් ඉන්ධන සඳහා වු බිල්පත් යනාදි විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

2.3.6 වත්කම් කළමනාකරණය

---------------------------------

සමික්ෂණය නොකළ වත්කම්

-----------------------------------

2013 දෙසැම්බර් 31 දිනට රු.33,648,386 ක් වු ස්ථාවර වත්කම් වටිනාකම සමික්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු වි නොතිබුණි.

2.3.7 වාහන

-----------

i. සමාලෝචිත වසර තුලදි සභාවට අයත් වාහන 2 ක් නිෂ්ක්‍රියව පැවතිණි.

ii. හානියට පත්ව තිබූ මයිලෝ මීටර නිසා වාහන දෙකකට අදාල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කළ නොහැකි විය.

2.4 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------------

i. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය

--------------------------------------------

2010 සහ 2011 වර්ෂ වලදී විවිධ ණයගැතියන් යටතේ ඇතුලත් කර තිබූ රු.2,059,122 ක් සඳහා වූ ව්‍යාපෘති හයක් සමාලෝචිත වර්ෂය තුල දී ද ක්‍රියාත්මක කර නොතිබුණි.

ii. අත්හැර දමන ලද ව්‍යාපෘති

-------------------------------

රු.5,750,000 ක් සඳහා වූ ව්‍යාපෘති පහක් අත්හැර දමා තිබුණි.

4. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(අ) ආදායම් එකතු කිරීම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) විවිධ තැන්පතු
(ඈ) මිශ්‍ර තැන්පතු
(ඉ) අත්තිකාරම්